# පරිසර හිතකාමී නව නිර්මාණ ඇගයීම - ජනාධිපති පරිසර සම්මාන 2022
# තරඟ කොන්දේසි සහ අයදුම්කරුවන් සඳහා අයදුම්පත සම්පූර්ණ කිරීමට අවශ්‍ය උපදෙස් හා මාර්ගෝපදේශ

## (පාසල් / විශ්වවිද්‍යාල සහ තෘතියික අධ්‍යාපන ආයතන / විවෘත අංශ සඳහා)

### *අයදුම්පත් යොමුකිරීම සඳහා සුදුසුකම්*

පාසල් (රාජ්‍ය, අර්ධ රාජ්‍ය, පෞද්ගලික), තෘතිය අධ්‍යාපන ආයතන හා විශ්වවිද්‍යාලයන් හි නව නිර්මාණකරනයෙහි යෙදෙන සිසුන් ඇතුළුව නිර්මාණශීලි ශ්‍රී ලාංකිකයින් හට (විවෘත අංශය) පරිසර හිතකාමී නව නිර්මාණ තරඟය සඳහා සහභාගි වීමට හැකිය.

### *තරඟය සඳහා ඉදිරිපත්විය හැකි අංශයන්*

- පාසල් අංශය
- විශ්වවිද්‍යාල සහ තෘතියික අධ්‍යාපන ආයතන අංශය
- විවෘත අංශය

### *පාසල් අංශය*

- පාසල් අංශය සඳහා වූ අයදුම්කරුවන් 9 සිට 13 වසර දක්වා පමණක් සීමාකර ඇති අතර, උපරිම වයස් සීමාව වනුයේ දෙවන වර අ.පො.ස. උසස් පෙළ පෙනී සිටින සිසුන්ගේ වයස් සීමාව වේ. එම වයස් සීමාවෙහි වූ සිසුන්ට පාසල් අංශය හැර වෙනත් අංශයකින් ඉදිරිපත් විය නොහැකිය. ඔවුන් අයදුම්පත ඉදිරිපත් කරන වර්ෂය තුළ පාසලක අධ්‍යාපනය හදාරමින් සිටිය යුතු අතර පාසල් හැර ගිය ශිෂ්‍යයන් නොවිය යුතුය.

- පාසල් සිසුන්ගේ කණ්ඩායම් නව නිපැයුම් සඳහා එක් කණ්ඩායමකට සහභාගි විය හැකි උපරිම සිසුන් ගණන 03 කි.

- පාසල් සිසුන් කණ්ඩායම් නව නිපැයුම් ඉදිරිපත් කිරීමේදී කණ්ඩායමේ අනිත් සාමාජිකයින් ද පාසල් සිසුන් වීම අනිවාර්යය වේ. පාසල් සිසුන්ට වෙනත් අංශයන්ගෙන් ඉදිරිපත් වන, නව නිර්මාණකරුවන්ගේ සාමාජිකයින් ලෙස ඉදිරිපත් විය නොහැකි ය.

### *විශ්වවිද්‍යාල සහ තෘතියික අධ්‍යාපන ආයතන අංශය*

- විශ්වවිද්‍යාල අංශය සඳහා ඉදිරිපත් වන ශිෂ්‍යයන් දැනට විශ්වවිද්‍යාලයක අභ්‍යන්තර ශිෂ්‍යයන් වශයෙන් පළමු උපාධිය සම්පූර්ණ කිරීමේ නියැලී සිටිය යුතුය.
- තෘතියික අධ්‍යාපන ආයතන නියෝජනය කරන ශිෂ්‍යයින් දැනට එම අධ්‍යාපන ආයතනයන්හි අධ්‍යාපන කටයුතු වල නියැලී සිටිය යුතුය. මෙම සිසුන් දෙපිරිසටම විශ්වවිද්‍යාල සහ තෘතියික අධ්‍යාපන ආයතන අංශය හැර වෙනත් අංශයකින් ඉදිරිපත් විය නොහැකිය.
- කණ්ඩායම් නව නිපැයුම් සඳහා එක් කණ්ඩායමකට සහභාගි විය හැකි උපරිම ගණන 03 කි.

### *විවෘත අංශය*

- ඉහත අංශයන්ට අදාළ නොවන සියළුම නව නිපැයුම්කරුවන්ට විවෘත අංශයෙන් “පරිසර හිතකාමී නව නිර්මාණ ඇගයීම්” තරඟය සඳහා ඉදිරිපත් විය හැකිය.

***අයදුම්පත් යොමුකිරීම සඳහා පොදු උපදෙස්***

- මධ්‍යම පරිසර අධිකාරිය මඟින් නිර්වචනය කර ඇති පරිදි අයදුම්කරුවන් ඉහත අදාළ අංශයන්ගෙන් හැර වෙනත් අංශයකින් අයදුම්පත් ඉදිරිපත් නොකළ යුතු අතර, එසේ නොමැති අයදුම්පත් මධ්‍යම පරිසර අධිකාරිය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

- ඔබ විසින් ඉදිරිපත් කරන සෑම නව නිපැයුමකටම එක් අයදුම්පත බැගින් ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ. එක් අයදුම්පතක නව නිපැයුම් එකකට වැඩි ගණනක් පිළිබඳව සටහන් කිරීම ඔබගේ අයදුම්පත් ප්‍රතික්ෂේප වීමට හේතුවක් වේ.

- අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2022.02.15 වේ. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත සම්පූර්ණ කර භාරදුන් පසු අයදුම්පතෙහි සිදුකරන කිසිදුවෙනස් කිරීමක් භාරගනු නොලැබේ.

- නිසි උපදෙස් පරිදි සම්පූර්ණ නොකළ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

- සම්පූර්ණ කරන ලද අයදුම්පත් "පාරිසරික හිතකාමී නව නිපැයුම් සඳහා අයදුම් කිරීම" යනුවෙන් ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරෙහි සඳහන් කර අධ්‍යක්ෂ, පර්යේෂණ හා සංවර්ධන, මධ්‍යම පරිසර අධිකාරිය, "පරිසර පියස" 104, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල යන ලිපිනයෙන් මධ්‍යම පරිසර අධිකාරිය වෙත යොමු කළයුතුය.

- නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත (word format) ajithr@cea.lk සහ tamasha@cea.lk යන විද්‍යුත් තැපැල වෙත ද යොමු කළ යුතුය.

- 2019-2021 වසරවලදි සිදුකරන ලද ක්‍රියාකාරකම් හා අදාල තොරතුරු අයදුම්පත්‍රයේ සඳහන් කළ යුතුය.

- ජනාධිපති පරිසර සම්මාන/ජාතික හරිත සම්මාන 2019 හි රන් සම්මානලාභීන් මෙම වර්ෂය සඳහා අයදුම් කළ නොහැක.

***බුද්ධිමය දේපළ අයිතිය***

තරඟය සඳහා ඉදිරිපත් කරනු ලබන නව නිපැයුම් ස්වනිර්මාණයන් විය යුතුය. වෙනත් පුද්ගලයෙකු විසින් නිර්මාණය කරන ලද නව නිපැයුමක් ප්‍රතිනිර්මාණය කර ප්‍රදර්ශනයට ඉදිරිපත් කිරීම නොකළ යුතුය. යම් හෙයකින් එසේ ඉදිරිපත් කර ජයග්‍රහණය කර ඇති අවස්ථාවකදි එම නව නිපැයුමේ මුල්හිමිකරුගේ බුද්ධිමය දේපළ අයිතිය උල්ලංඝනය වී ඇති බව නිසි සාක්ෂි සහිතව තහවුරු වුවහොත් ප්‍රදානය කරන ලද ත්‍යාග හා සියළුම සහතික පත්‍ර ආපසු ලබා ගැනීමට මධ්‍යම පරිසර අධිකාරිය කටයුතු කරන අතර, එසේ ආපසු ලබාදීම සඳහා තරඟකරු බැඳිසිටී.

***තරඟ විනිශ්චය***

ඔබ විසින් යොමුකරන අයදුම්පත් මධ්‍යම පරිසර අධිකාරිය විසින් පත් කරනු ලබන ඇගයීම් කමිටුවක් වෙත යොමුකර ඉන් හොඳම නිර්මාණ තෝරාගනු ලබයි.

මධ්‍යම පරිසර අධිකාරිය මඟින් අනුමත විනිශ්චය මණ්ඩල කමිටුවේ තීරණය අවසන් තීරණය වේ.

***තරඟය සඳහා ඉදිරිපත් වියහැකි ක්ෂේත්‍ර***

පරිසර සංරක්ෂණ සහ කළමනාකරණය උදෙසා සිදු කරන ලද නව නිපැයුම් සහ සොයාගැනීම් මේ සඳහා අදාළ වේ.

# පරිසර හිතකාමී නව නිර්මාණ ඇගයීම - ජනාධිපති පරිසර සම්මාන 2022

## සහභාගිත්වය සඳහා අයදුම්පත්‍රය

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

පරිසර හිතකාමී නව නිර්මාණ සඳහා ඉදිරිපත් වන අංශය :

☐ පාසල් අංශය - 9 සිට 13 වසර දක්වා

☐ විශ්වවිද්‍යාල සහ තෘතීයික අධ්‍යාපන ආයතන අංශය

☐ විවෘත අංශය

01) අයදුම්කරුගේ සම්පූර්ණ නම :.................................................................

.................................................................

02) මුලකුරු සමඟ නම : .................................................................

03) ස්ත්‍රී/ පුරුෂභාවය : .................................................................

04) ලිපිනය (පෞද්ගලික) : .................................................................

05) දුරකථන අංකය (පෞද්ගලික): ................................

විද්‍යුත් තැපැල් ලිපිනය : ................................

06) ජාතික හැඳුනුම්පත් අංකය : ......................... උපන් දිනය : ..................

07) වයස : ..................................

08) දිස්ත්‍රික්කය : ............................................................

09) පළාත : ............................................................

10) නව පරිසර හිතකාමී නිර්මාණයේ නම : ......................................................

.................................................................................................

.................................................................................................

11) ඔබගේ නව නිර්මාණය ඒකපුද්ගල නිර්මාණයක් ද, කණ්ඩායම් නිර්මාණයක් ද යන්න?

☐ ඒකපුද්ගල ☐ කණ්ඩායම්

(කණ්ඩායම් නව නිපැයුමක් නම් සියළුම සාමාජිකයන්ගේ නම්, ලිපිනයන්, දුරකථන අංක සහ සහතික පත්‍රයේ සඳහන් වියයුතු නම අයදුම්පත සමඟ අමුණා එවන්න. පාසල් අයදුම්කරුවන්ගේ කණ්ඩායමට ඇතුළත් වියහැකි උපරිම සාමාජිකයින් සංඛ්‍යාව 03 කි)

12) නව නිර්මාණය පිළිබඳ කෙටි විස්තරයක් (නිර්මාණය පිළිබඳ වැඩි දුර විස්තර, ඡායාරූප, වීඩියෝපට අයදුම්පත සමඟ ඇමුණුමක් ලෙස එවිය යුතුයි)

………………………………………………………………………………………………
………………………………………………………………………………………………..
………………………………………………………………………………………………
………………………………………………………………………………………………..

13) ඔබගේ නව නිර්මාණය සඳහා බුද්ධිමය දේපළ හිමිකම් (පේටන්ට් බලපත්‍රය) ලබාගෙන හෝ ඒ සඳහා ඉල්ලුම් කර තිබේ ද?

☐ ඔව් ☐ නැත

i. බුද්ධිමය දේපළ හිමිකම් ලබාගෙන තිබේ නම්,

බලපත්‍ර අංකය :…………………… නිකුත් කළ දිනය :…………………..

ii.පේටන්ට් බලපත්‍රය සඳහා අයදුම්කර තිබේ නම්,

අයදුම් කළ දිනය : …………………… යොමු අංකය : …………………..

මා විසින් සඳහන් කළ තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවත්, මා විසින් විස්තර කර ඇති නව නිර්මාණයේ අයිතිය මා සතු බවත්, පහත අත්සන යොදා සහතික කරමි. තවද ජනාධිපති පරිසර සම්මාන 2022 අදාළව මධ්‍යම පරිසර අධිකාරිය විසින් පනවනු ලබන කොන්දේසි වලට මා එකඟ වන බව ද සහතික කරමි.

දිනය : …………………… අත්සන : ……………………

**විශ්වවිද්‍යාල සහ තෘතියික අධ්‍යාපන ආයතන අංශයෙන් ඉදිරිපත් වන සිසුන් සඳහා**

01) විශ්වවිද්‍යාලයේ/තෘතියික අධ්‍යාපන ආයතනයේ නම : ……………………………………..

……………………………………………………………………………………………...

02) විශ්වවිද්‍යාලයේ/තෘතියික අධ්‍යාපන ආයතනයේ ලිපිනය : ...…………………………………

……..…………………………………………………………………………………………

……………………………………………………………………………………………..

03) ශිෂ්‍ය ලියාපදිංචි අංකය : .....……………………………

---

**විශ්වවිද්‍යාලයේ පීඨාධිපතිතුමන්ගේ / තෘතියික අධ්‍යාපන ආයතනයේ ප්‍රධානියාගේ නිර්දේශය**

.............................................. ..............................................

අත්සන නිල මුද්‍රාව

..............................................

දිනය

## පාසල් අංශයෙන් ඉදිරිපත් වන සිසුන් සඳහා

**මෙම තරඟය සඳහා ඉදිරිපත් විය හැක්කේ 9 සිට 13 වසර දක්වා ඉගෙනුම ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට පමණි.**

01) පාසලේ නම :……………………………………………………………………………

…………………………………………………………………………………………..……

02) පාසලේ ලිපිනය :…………………………………………………………………………

…………………………………………………………………………………………..……

---

**විදුහල්පතිතුමා/ තුමියගේ නිර්දේශය**

ඉහත නම සඳහන් ........................................................................................ ශිෂ්‍යයා / ශිෂ්‍යාව දැනට ......................................................................................... විද්‍යාලයේ අධ්‍යාපන කටයුතු වල නියැලී සිටින බවත්, ඔහු / ඇය විසින් ප්‍රකාශිත තොරතුරු මාගේ දැනීම අනුව සත්‍ය හා නිරවද්‍ය බවත්, මෙම නිර්මාණය ඔහුගේ / ඇයගේ ස්වනිර්මාණයක් බවට සහතික කරමි.

**විදුහල්පතිතුමා/ තුමියගේ නම :** ..........................................................................................

............................................ ............................................

අත්සන නිල මුද්‍රාව

............................................

දිනය